# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No } 10120

ෆැක්ස් / தொலைநகல / Fax } 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site } www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail } dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO } 1340 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No } / 2023

දිනය / திகதி / Date } 24/10/2023 පැය 0730

## මාධ්‍ය නිවේදනය

**01. බිරිඳ ඝාතනය කර සැමියා ගෙල වැලලාගෙන මියයාමක් - පූගොඩ පොලිස් වසම.**

2023.10.23 වන දින රාත්‍රී කාලයේ පූගොඩ පොලිස් වසමේ මණ්ඩාවල ප්‍රදේශයේ පවුල් ආරවුලක් හේතුවෙන් බිරිඳට තියුණු ආයුධයකින් පහරදී ඇති බවට පූගොඩ පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. පොලිස් නිලධාරීන් විසින් අදාල සිද්ධය වූ ස්ථානය පරීක්ෂා කිරීමේදී සැමියා විසින් බිරිඳගේ ගෙල කපා නිවස තුල ඝාතනය කර ඇති බවට නිරීක්ෂණය වී ඇත. පසුව සැකකරු අත්අඩංගුවට ගැනීමට විමර්ශන සිදුකිරීමේදී සැකකරුද නිවස ආසන්න ප්‍රදේශයේ ගසක ගෙල වැලලාගෙන මියගොස් සිටියදී හමුවී ඇත.

**මරණකාරිය වයස අවුරුදු 46 ක් වන අතර, මරණකරු වයස අවුරුදු 54 ක් වූ මණ්ඩාවල, පූගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

දෙදෙනා අතර කලක සිට පවුල් ආරවුල් පැවති බවට මූලික විමර්ශනයේදී අනාවරණය වී ඇත. මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා මෘත ශරීර පොලිස් ආරක්ෂාව යටතේ සිද්ධිය වූ ස්ථානවල ඇත. පූගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කළ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගාල්ල පොලිස් ස්ථානය.**

2023.10.23 වන දින උදෑසන කාලයේ ගාල්ල පොලිස් වසමේ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිරිපිටදී එම කාර්යාලයේම අනියම් කම්කරුවන් පිරිසක් තම සේවය ස්ථිර කර දෙන ලෙසට ඉල්ලා විරෝධතාවයක් පවත්වා අනතුරුව පිරිස පා ගමනින් ආණ්ඩුකාර කාර්යාලය වෙත ගොස් එම කාර්යාලය ඉදිරිපිටදී විරෝධතාවය දක්වා ඇත.

එම පිරිසෙන් පුද්ගලයින් 05 දෙනෙකුට ගරු ආණ්ඩුකාර තුමාගේ ලේකම්තුමිය සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව ලබාදී ඇත. එම සාකච්ඡාවෙන් පසුව නැවත ආණුඩුකාර කාර්යාලය අවහිර කරමින් විරෝධතාවය සිදුකරමින් පිරිසක් ප්‍රධාන දොරටුව තල්ලු කරමින් ආණ්ඩුකාර තුමාගේ කාර්යාලයට ඇතුළු වීමට උත්සහා කිරිමේදී එය වලක්වාලීමට කටයුතු කළ එම ස්ථානයේ රාජකාරි යෙදී සිටි පොලිස් නිලධාරියෙකුට

පහර දීමක් හේතුවෙන් තුවාල ලබා කරාපිටිය රෝහල වෙත ඇතුලත් කර ඇත. මෙම පහරදීම සිදුකළ සැකකරුවන් දෙදෙනෙකු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 39 හා 42 වයස්වල පසුවන තල්පේ හා ගාල්ල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගාල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**03. පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කළ සැකකරුවන් දෙදෙනෙකු හා සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට - රඹුක්කන පොලිස් ස්ථානය.**

2023.10.23 වන දින සවස් කාලයේ රඹුක්කන පොලිස් වසමේ තිස්මල්පොල ප්‍රදේශයේ හෙරොයින් මත්ද්‍රව්‍ය වැටලීමක් සඳහා පිටව ගිය නාරම්බැද්ද පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීමට යාමේදී පොලිස් නිලධාරීන් දෙදෙනාට අතින් පයින් ,පොලු වලින් හා තියුණු ආයුධයකින් පහරදීමක් සිදුකර ඇත. පහරකෑමෙන් තුවාල ලැබූ පොලිස් කොස්තාපල්වරුන් දෙදෙනා රඹුක්කන රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කෑගල්ල රෝහල වෙත මාරු කර යවා ඇත. මෙම පහරදීම සම්බන්ධයෙන් සැකකරුවන් දෙදෙනෙකු හා සැකකාරියන් දෙදෙනෙකු රඹුක්කන පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 35 හා 25 වයස්වල පසුවන අතර සැකකාරියන් 34 හා 59 වයස්වල පසුවන රඹුක්කන ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

රඹුක්කන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**04. බඳින කඳක් පත්තුවී දරුවෙකු තුවාලවීමක් - මීගලෑව පොලිස් වසම.**

2023.10.23 වන දින සවස් කාලයේ මීගලෑව පොලිස් වසමේ වීරගොල්ල ප්‍රදේශයේදී සතුන්ට අටවන ලද බඳින තුවක්කුවක් පත්තුවී දරුවෙකු තුවාල ලබා රෝහලට ඇතුලත් කර ඇති බවට මීගලෑව පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත. තුවාල ලැබූ දරුවා මීගලෑව රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා තඹුත්තේගම රෝහල මාරු කර යවා ඇත.

**තුවාල ලැබූ දරුවා වයස අවුරුදු 15 ක් වූ වීරගොල්ල, මීගලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වගාවකට සිටුවීම සඳහා ඉනි කිහිපයක් කපා ගැනීම සඳහා තුවාල ලැබූ දරුවා නිවස අසල තිබූ කැලෑ ප්‍රදේශයට යහළුවන් දෙදෙනෙකු සමඟ ගොස් ඇති අතර, එම අවස්ථාවේදී මෙලෙස බඳින තුවක්කුව පත්තුවී ඇති බවට පොලිසිය කළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. මීගලෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**